# මැනිලා ප්‍රඥප්තිය



# පෘථිවි ප්‍රඥප්තිය

## පූර්විකාව

මනුෂ්‍යත්වය විසින්ම තමන්ගේ අනාගතය තෝරාගත යුතු ,පෘථිවි ඉතිහාසයේ මහත් වැදගත් අවස්ථාවක අපි සිටින්නෙමු. ලෝකය ක්‍රම ක්‍රමයෙන් වඩාත් අන්තර්සම්බන්ධිත සහ වඩ වඩාත් අවධානමට ලක්වන තරමට, අනාගතය තුළ සැලකියයුතු අවස්ථාවන් සහ අභියෝගයන් ඇති කරයි. මේ තුළින් ඉදිරියට පියමං කිරීමට නම් සංස්කෘතික සහ ජීව විවිධත්වයෙන් සමන්විත මෙවන් ලෝකයක අපි එකම මානුෂිය පවුලක් සහ පොදු ඉරණමක් සහිත එක් පෘථිවි ප්‍රජාවක් බව හඳුනාගත යුතුය. අපි සියලු දෙනා එක්ව, ස්වභාවධර්මය පිළිබඳ ගෞරවය, විශ්වීය මානව හිමිකම් , ආර්ථික යුක්තිගරුකභාවය සහ සාමය පදනම් වූ තිරසාර ගෝලීය සමාජයක් ගොඩනගා ගත යුතුය.
මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා , පෘථිවිවාසී ජනතාව වන අප එකිනෙකාට, වඩාත් උසස් ජීවන ප්‍රජාවකට සහ අනාගත පරම්පරාවක් උදෙසා අපගේ වගකීම ප්‍රකාශ කිරීම කළ යුතුය.

## පෘථිවිය, අපගේ නිවහනයි.

මනුෂ්‍යත්වය යනු පරිණාමය වෙමින් පවතින දැවැන්ත විශ්වයක කොටසකි. අපගේ නිවහන වන පෘථිවිය අද්විතීය ජීව ප්‍රජාවකින් ජීවමාන වී ඇත. ස්වභාවධර්මයේ බලවේග මඟින් පෘථිවිය මත පැවැත්ම අවිනිශ්චිත අවදානමක් බවට පත්කර ඇති නමුත් පෘථිවිය ජීවයේ පරිණාමයට අවශ්‍ය කොන්දේසි සපයා ඇත. ජීව ප්‍රජාවේ ඔරොත්තු දීමේ හැකියාව සහ මානව වර්ගයාගේ යහපැවැත්ම රඳා පවතින්නේ එහි සියලු පාරිසරික පද්ධති , විවිධ ශාක සහ සතුන්, සාරවත් පස , පිරිසිදු ජලය සහ පිරිසිදු වාතය සහිත සෞඛ්‍ය සම්පන්න ජෛව ගෝලයක් ආරක්ෂා කිරීම මතය.  සීමිත සම්පත් සහිත ගෝලීය පරිසරය  සියලු ජනතාවගේ සැලකිල්ලට භාජනය වන පොදු කරුණකි. පෘථිවියේ ජීව ශක්තිය, විවිධත්වය සහ අලංකාරය ආරක්ෂා කිරීම අප සතු පූජනීය කාර්යයකි.

## ගෝලීය තත්වය

නිෂ්පාදනයේ සහ පරිභෝජනයේ සිදුවන ප්‍රධාන රටා මඟින් පරිසර විනාශය, සම්පත් ක්ෂයවීමට සහ ඒවා විශාල වශයෙන් වඳවී යාමටත් හේතුවේ. මේ හේතුවෙන් මිනිස් සම්පත යටපත් වෙමින් පවතී. අයුක්තිය, දරිද්‍රතාව,නොදැනුවත්කම සහ ප්‍රචණ්ඩ ගැටුම් බහුලව  දක්නට ලැබෙන අතර එය බේදාන්තයකට හේතුවකි. මිනිස් ජනගහනයේ පෙර නොවූ විරූ වැඩිවීමක් සිදුව ඇති බැවින් පාරිසරික සහ සමාජ පද්ධති මත අධික බරක් පැටවී ඇත.  මෙමඟින් ගෝලිය ආරක්ෂාවේ පදනම තර්ජනයට ලක් වී ඇත. මෙම ප්‍රවණතා භයානක නමුත් නොවැළැක්විය හැකි තත්වයන් ය.

## ඉදිරි අභියෝග

තේරීම අප සතුය: පෘථිවිය සහ අප එකිනෙකා රැකබලාගැනීම සඳහා ගෝලීය වශයෙන් හවුල්කාරීත්වයක් ඇතිකරගැනීම මඟින් අප කෙරෙහි හා ජෛව විවිධත්වය කෙරෙහි ඇති අවදානම අවම කිරීම සිදු කළ යුතුය. එමෙන්ම අපගේ වටිනාකම්, ආයතන සහ ජීවන මාර්ගවල මූලික වෙනස්කම් සිදුකළ යුතුය. මෙහිදී අප තේරුම්ගත යුත්තේ ජීවත් වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ වී ඇති විට මානව සංවර්ධනය යනු අවශ්‍යතා වැඩිපුර ළඟා කරගැනීම නොවන බවයි. සියලු දෙනාගෙ අවශ්‍යතා සැපයීමට සහ පරිසරයට අපගෙන් වන බලපෑම අවම කිරීමට අවශ්‍ය දැනුම හා තාක්ෂණය මේ වනවිට අපට ලැබී ඇත. ගෝලීය සිවිල් සමාජයක මතුවීම ප්‍රජාතන්ත්‍රවාදී සහා මානුෂීය ලෝකයක් ගොඩ නැඟීම සඳහා නව අවස්ථාවන් නිර්මාණය කරමින් පවතී. අපගේ පාරිසරික , ආර්ථික, දේශපාලනික, සමාජිය සහ අධ්‍යාත්මික අභියෝග එකිනෙකට සම්බන්ධ වී ඇති අතර, අපි සියල්ලන්ටම මේ සඳහා එක්ව විසඳුම් සකස් කළ හැකිය.

## විශ්වීය වගකීම

මෙම අභිලාෂයෙන් සාක්ෂාත් කරගැනීම සඳහා අප විශ්වීය වගකීමකින් ජීවත් වියයුතු අතර,එය සමස්ත පෘථිවිවාසීන් ලෙස මෙන්ම දේශීය ප්‍රජාවන් ලෙසද හඳුනාගත යුතුය. අප විවිධ ජාතීන්ගෙන් සමන්විත එකම පුරවැසියන් වන අතර දේශීය සහ ගෝලීය වශයෙන් සම්බන්ධ වී සිටින්නෙමු. මානව සංහතියේ වර්තමාන සහ අනාගතයේ යහපැවැත්ම උදෙසා සහ පෘථුල ජීවමාන ලෝකයක් උදෙසා අප සියලු දෙනාම මෙම වගකීම බෙදාගත යුතුය. මිනිසා සොබාදහම තුළ තමාට හිමි ස්ථානය සහ පැවැත්ම මෙන්ම ත්‍යාගලද ජීවිතය සම්බන්ධයෙන් කෘතඥතාවයෙන් මෙන්ම නිහතමානීව ජීවත්වන විට මානව සහයෝගීතාව ශක්තිමත් වේ.

නැගී එන ලෝක ප්‍රජාවේ ආචාරධර්ම පදනම සඳහා මූලික වටිනාකම් සහිත, බෙදාගත් දැක්මක් කඩිනමින් අවශ්‍ය වේ. එබැවින් සියලු පුද්ගලයන්, සංවිධාන, ව්‍යාපාර, රජයන් සහ අන්තර්ජාතික ආයතන වල හැසිරීම මෙහෙයවනු ලබන සහ තක්සේරු කරනු ලබන පොදු ප්‍රමිතියක් ලෙස තිරසාර ජීවන රටාවක් සඳහා පහත සඳහන් අන්තර් මූලධර්ම අපි එක්ව තහවුරු කරමු.

;

# මූලධර්ම

## I. ප්‍රජාව කෙරෙහි ගරුත්වය සහ සුරැකීම ලබාදීම

### 1. පෘථිවියේ සහ ජීවයේ සෑම විවිධත්වයක් කෙරෙහිම ගරුත්වයක් දැක්වීම.

අ) මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් පවත්නා වූ වටිනාකම කෙසේ වුවද සියලුම ජීවින් එකිනෙකා හා බැඳුනු ලෙස පිළිගැනීම හා ජීවයේ සෑම විශේෂයකටම වටිනාකමක් පවතින බව පිළිගැනීම

ආ) ආවේණික ගරුත්වයන් සහ මනුෂ්‍ය ප්‍රජාව තුළ පැවතිය යුතු බුද්ධිමය, කලාත්මක, ආචාර ධාර්මික හා ආධ්‍යාත්මික විශ්වාසයන් තහවුරු කරලීම

### 2. ආදරය කරුණාව සහ අවබෝධ කරගැනීම සමඟ ජීව ප්‍රජාව සුරැකීම.

අ) පාරිසරික හානි වැළැක්වීමට හා පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂි කිරීමේ යුතුකම සහිතව ස්වභාවික සම්පත් අත්පත් කරගැනීමට, කළමණාකරණයට සහ භාවිතයට ඇති අයිතිය පිළිගැනීම

ආ) පොදු යහපත ප්‍රවර්ධනය කිරීමේ වගකීම වැඩිදියුණු කිරීමෙහිලා නිදහස, දැණුම සහ ශක්තීන් වැඩිදියුණු කළ යුතු බව තහවුරු කිරීම

### 3. යුක්ති සහගත , සහභාගී, තිරසාර සහ සාමකාමී ප්‍රජාතාන්ත්‍රික සමාජ ක්‍රමයක් ගොඩගැනීම

අ) සියල්ලන්ටම තමාගේ මුළු හවයතාවයන් වටහා ගැනීමට අවස්ථාවක් ලබාදීම හා සෑම මට්ටමකම ප්‍රජාවන්ගේ මානව අයිතීන් සහ මූලික නිදහස සහතික කිරීම

ආ) සියල්ලන්ටම ආරක්ෂිත හා අර්ථවත් ජීවිකාවක් ළගා කරගැනීමෙහිලා වන සමාජ ආර්ථික යුක්තිය ප්‍රවර්ධනය කිරීම

### 4. වර්තමාන හා අනාගත පරම්පරාව වෙනුවෙන් පෘථිවියේ දායාද සුරක්ෂිත කිරීම

අ) සෑම එක් එක් පරම්පරාවෙම ක්‍රියාත්මක වීමට ඇති නිදහස අනාගත පරම්පරාවේ අවශ්‍යතා මත සීමා වී ඇති බව හඳුනාගැනීම

ආ) පාරිසරික ප්‍රජාවගේ හා පෘථිවියේ මනුෂ්‍යයාගේ දීර්ඝකාලීන උන්නතියට සහයක් විලස අනාගටහ පරම්පරාවට වටිනාකම් සම්ප්‍රදායන් හා ආයතන උරුම කරදීම

## II. පාරිසරික අඛණ්ඩතාවය

**5. ජීවය පවත්වාගෙන යනු ලබන ජෛව විවිධත්වයට හා ස්වභාවික ක්‍රියාදාමයන් වෙත විශේෂ අවධානය යොමුකරමින් , පෘථිවියේ පාරිසරික පද්ධතීන්ගේ අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම හා නැවත පිහිටුවාලීම**

අ) පරිසරය සංරක්ෂණය කිරීමෙහිලා වන සියලු සංවර්ධන ක්‍රියාන්විතයකදීම සෑම මට්ටමකම තිරසාර සංවර්ධන සැලසුම් හා රෙගුලාසි යොදාගැනීම.

ආ) පෘථියේ ජීවයට සහය වන පද්ධතීන් ආරක්ෂා කිරීමට ජෛව විවිධත්වය පවත්වාගෙන යාමට ජාතික උරුමයන් සංරක්ෂණය කිරීමට වන භූමි, සාගර ප්‍රදේශය ඇතුළත්ව ජෛව සංචිත හා ජෛවීය ස්වභාවධර්මය ස්ථාපිත කිරීම සහ ආරක්ෂා කිරීම

ඇ) තර්ජනයට ලක්වූ සත්ව විශේෂයන් හා පරිසර පද්ධතීන් ප්‍රතිසාධනය කිරිම

ඈ) දේශිය විශේෂයන්ට හානිකර වන ජානමය වශයෙන් විකෘති කරන ලද ව්‍යුහාත්මක සංඝටක හෝ ස්වදේශීය නොවන සංඝටක පාලනයට නතු කිරීම හෝ මර්දනය කිරීම

ඉ) ජලය, පස, වනාන්තර නිෂ්පාදන සහ සාගර ජීවීන් වැනි නැවත නැවත භාවිතයට ලබාගත හැකි ගුණාත්මක පරිසර පද්ධතීන් තුළ ඇති සම්පත් පුනර්ජනනීය වීමේ මට්ටම ඉක්මවා නොයන ආකාරයට හා පෝෂණීය පරිසර පද්ධති සුරැකෙන අන්දමින් ඒවායේ භාවිතය හා කළමනාකරණය කිරීම

ඊ) නැවත නැවත භාවිතා කළ නොහැකි ඛනිජ සම්පත් පොසිල ඉන්ධන ආදී සම්පත් වානිජමය ලෙස උපයෝගී කර ගැනීමේදී පරිසරයට බරපතල හානි සිදු නොවන ආකාරයට කළමණාකරණය කිරීම

**6. පරිසරය ආරක්ෂා කිරීමේ යෝග්‍යතම ක්‍රමවේදය ලෙස හානි වැළැක්වීම සහ දැනුම සීමිත විට පූර්වාරක්ෂිත ක්‍රියාවලියක් අදාල කරගැනීම**

අ) විද්‍යාත්මක දැනුම පරිපූර්ණ නොවන විට හා අවිනිශ්චිත විට ඇතිවිය හැකි , නොවැළැක්විය හැකි සහ දැඩි පාරිසරික හානි මඟහරවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම

ආ) යෝජිත ක්‍රියාවලීන් සැලකියයුතු බලපෑමක් ඇති නොකරන ලෙසට තර්ක කරන පාර්ශවයන් හට එය ඔප්පු කිරීමේ භාරය හා පාරිසරික හානි සම්බන්ධයෙන් වන වගකීම අදාළ වගකිවයුතු පාර්ශවයන් වෙත පැවරීම සිදුකිරීම

ඇ)මානව ක්‍රියාකාරකම්වල සමුච්චිත, දීර්ඝකාලීනව ගෝලීය වශයෙන් ඇතිවන ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් තීරණ සැකසීමේ ක්‍රියාවලිය තහවුරු කිරීම

ඈ) විකිරණශීලී විෂ සහිත හෝ වෙනත් යම් අන්තරායක ද්‍රව්‍යයන් ගොඩනැගීමට ඉඩ ලබා නොදීම ඇසුරෙන් පරිසරයේ ඕනෑම කොටසක සිදුවිය හැකි දූෂණය වළක්වාලීම

ඉ) පරිසරයට හානි කරවන අන්දමේ යුධමය ක්‍රියාවන් මග හරවාලීම

## 7. පෘථිවියේ පුනර්ජනනීය ශක්‍යතාවයන්, මානව හිමිකම් සහ පොදු සමාජ සුභසාධනය ආරක්ෂා වන අන්දමින් නිෂ්පාදනයේ ක්‍රම පරිභෝජනයට සහ නැවත් නිෂ්පාදන ක්‍රම ඇතිකිරීම

අ) පරිභෝජන ක්‍රමවේදය සහ නිෂ්පාදන ක්‍රමවේදය තුල පවත්නා අමුද්‍රව්‍ය භාවිතය අඩුකිරීම, නැවත භාවිතය මෙන්ම අවශේෂ අපද්‍රව්‍යයන් පරිසර පද්ධතියට අවශෝෂණය කරගැනීමේ ක්‍රමයන් තහවුරු කිරීම

ආ) සූර්ය ශක්තිය, සුළං ශක්තිය වැනි පුනර්ජනනීය ශක්තීන් භාවිතා කිරීමේදී කාර්‍යක්ෂම අන්දමින් සකසුරුවම් සහිතව භාවිතයට ක්‍රියාත්මක වීම

ඇ) පාරිසරික සෞඛ්‍යයට හිතකරවන අන්දමේ තාක්ෂණයන් සංවර්ධනයන් ගොඩ නැංවීම සහ සාධාරණ මාරු කිරීම් සිදුකිරීම

ඉ) භාණ්ඩ හා සේවාවල සම්පූර්ණ පාරිසරික සමාජ පිරිවැය විකුණුම්මිලට අභ්‍යන්තරීකරණය කිරීම සහ ඉහළම සමාජීය සහ පාරිසරික ප්‍රමිතීන් සපුරාලන නිෂ්පාදන හඳුනාගැනීමට පාරිභෝගිකයන්ට හැකියාව ලබාදීම.

ඊ) ප්‍රජනන සෞඛ්‍ය වර්ධනය කරන සෞඛ්‍ය ආරක්ෂණය සම්බන්ධ විශ්වීය ප්‍රවේශය සහතික කිරීම

උ) සීමිත ලෝකය තුළදී ගුණාත්මක ජීවිතය සහ ද්‍රව්‍යමය ප්‍රමාණවත් බව අවධාරණය කරන ජීවන රටාවන් අනුගමනය කිරීම.

## 8. පරිසර තිරසාරභාවය පිළිබඳ අධ්‍යනය ඉහළ නැංවීම සහ ලබාගත් දැනුම විවෘත හුවමාරුව සහ පුළුල් ලෙස ප්‍රවර්ධනයේ යෙදීම

අ) සංවර්ධනය වෙමින් පවතින ජාතීන්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින්, තිරසාර සංවර්ධනය පිළිබඳව ජාත්‍යන්තර විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගීතාවයට සහය දීම

ආ) පාරිසරික ආරක්ෂාවට සහ යහපැවැත්මට දායකවන සියලුම සංස්කෘතීන්හී සාම්ප්‍රදායික දැනුම සහ අධ්‍යාත්මික ප්‍රඥාව හඳුනාගෙන ආරක්ෂා කිරීම

ඇ) ජානමය තොරතුරු ඇතුළුව මානව සෞඛ්‍යට සහ පරිසර ආරක්ෂණයට අත්‍යවශ්‍ය තොරතුරු පොදු වසම තුල පවතින බව සහතික කිරීම

# III. සමාජ සහ පාරිසරික යුක්තිය

## 9. සදාචාරාත්මක , සමාජීය සහ පාරිසරික අවශ්‍යතාවයක් ලෙස දරිද්‍රතාවය තුරන් කිරීම

අ) අවශ්‍ය ජාතික හා ජාත්‍යන්තර සම්පත් වෙන් කරමින්, පානීය ජලය, පිරිසිදු වාතය, ආහාර සුරක්ෂිතතාවය, දූෂිත නොවුණු පස, නවාතැන් සහ ආරක්ෂිත සනීපාරක්ෂාවට ඇති අයිතිය සහතික කිරීම

ආ) සියලු මනුෂ්‍යයන් අධ්‍යාපනයෙන් සහ තිරසාර ජීවනරටාවක් සුරක්ෂිත කිරීම සඳහා වන

මූලාශ්‍රයන්ගෙන් බලගැන්වීම සහ තමා විසින් තමන්ව නඩත්තු කිරීමට නොහැකි අය සඳහා සමාජ ආරක්ෂාව සහ ආරක්ෂිත ජාලයක් සැකසීම.

ඇ) නොසලකා හරින්නන් හඳුනාගැනීම, වින්දිතයන් ආරක්ෂා කිරීම, දුක්විඳින්නන්ට සේවය කිරීම සහ ඔවුන්ගේ ශක්නුතාවය අනුව සංවර්ධනය වීමට ඉඩ සැලසීම සහ ඔවුන්ගේ අභිලාෂයන් ඉටුකිරීම

**10.** සියලු මට්ටම් වල ආර්ථික ක්‍රියාකාරකම් සහ ආයතන, සාධාරන සහ තිරසාර ආකාරයකින් මානව සංවර්ධනය ප්‍රවර්ධනය කරන බව සහතික කිරීම

අ) ජාතීන් තුළ සහ ජාතීන් අතර ධනය සාධාරණ ලෙස බෙදාහැරීම ප්‍රවර්ධනය කිරීම

ආ) සංවර්ධනය වෙමින් පවතින රටවල බුද්ධිමය, මූල්‍යමය, තාක්ෂණික සහ සමාජීය සම්පත් වැඩි දියුණු කිරීම සහ ඔවුන් දැඩි ජාත්‍යන්තර ණය බරින් මුදාහැරීම

ඇ) සියලුම වෙළඳාම , තිරසාර සම්පත් භාවිතය, පාරිසරික ආරක්ෂාව, සහ ප්‍රගතිශීලී කම්කරු ප්‍රමිතීන්ට සහයවන බව සහතික කිරීම

ඈ) සියලු බහුජාතීය සමාගම් සහ අන්තර්ජාතික මූල්‍ය සංවිධාන මහජන යහපත උදෙසා විනිවිදභාවයෙන් ක්‍රියා කිරීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකීම රඳවාගනියි.

**11. තිරසාර සංවර්ධනය සඳහා පූර්ව අවශ්‍යතා ලෙස ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම සහ අධ්‍යාපනය, සෞඛ්‍ය ආරක්ෂාව සහ ආර්ථික අවස්ථා සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම**

අ) කාන්තාවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම

ආ ) ආර්ථික, දේශපාලන, සිවිල්, සමාජීය සහ සංස්කෘතික ජීවිතයේ සියලු අංශවල කාන්තාවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය , පූර්න හා සමාන හවුල්කරුවන් , තීරණගන්නන්, නායකයින් සහ ප්‍රතිලාභීන් ලෙස ප්‍රවර්ධනය කිරීම

ඇ) සියලු පවුල් ශක්තිමත් කිරීම සහ සෑම සාමාජිකයන්ගේම ආරක්ෂාව සහ ආදරණීය ස්වභාවය සහතික කිරීම

12. **ආදිවාසී ජනතාවගේ සහ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මානව ගරුත්වය, ශාරීරික සෞඛ්‍යය සහ අධ්‍යාත්මික යහපැවැත්මට සහය වන ස්වභාවික හා සමාජීය පරිසරයකට, වෙනස්කම් කිරීමකින් තොරව, සෑමට ඇති අයිතිය තහවුරු කිරීම .**

අ) ජාතිය, වර්ණය, ලිංගිකත්වය, ආගම, භාෂාව සහ ජාතික ජනවාර්ගික හෝ සමාජ සම්භවය වැනි සියලු ආකාර වලින් වෙනස්කම් කිරීම තුරන් කිරීම

ආ) ආදිවාසී ජනතාවට ඔවුන්ගේ ආධ්‍යාත්මික දැනුම සහ සම්පත් සඳහා ඇති අයිතිය සහ තිරසාර ජීවනෝපාය සඳහා ඔවුන්ගේ භාවිතයන් සඳහා අති අයිතිය තහවුරු කිරීම

ඇ) තිරසාර සමාජයක් නිර්මාණය කිරීමේදී ඔවුන්ගේ අත්‍යවශ්‍ය කාර්යභාරය ඉටු කිරීමට හැකිවන පරිදි අපගේ ප්‍රජාවන්හී තරුණයන්ට ගෞරව කිරීම සහ සහය දීම

ඈ) සංස්කෘතික හා අධ්‍යාත්මික වැදගත්කමක් ඇති කැපීපෙනෙන ස්ථාන ආරක්ෂා කිරීම සහ ප්‍රතිසංකරණය කිරීම

## IV. ප්‍රජාතන්ත්‍රවාදය, අවිහිංසාව සහ සාමය

### 13. සියලු මට්ටම් වල ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීම සහ පාලනයේ විනිවිදභාවය සහ වගවීම, තීරණගැනීමේදී සහභාගීත්වය සහ යුක්තිය සඳහා ප්‍රවේශය ලබාදීම.

අ) පාරිසරික කරුණු සහ ඔවුන්ට බලපාන හෝ උනන්දුවක් දක්වන පූර්ණ සංවර්ධන සැලසුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳව පැහැදිලි සහ කාලෝචිත තොරතුරු සෑම කෙනෙකුටම ලැබීමේ අයිතිය තහවුරු කිරීම

ආ) දේශීය, කලාපීය සහ, ගෝලීය සිවිල් සමාජයට සහය වීම සහ තීරණ ගැනීමේදී උනන්දුවක් දක්වන සියලු පුද්ගලයන්ගේ සහ සංවිධානවල අර්ථවත් සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම

ඇ) භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ඇති අයිතිය, සාමකාමී රැස්වීම් සහ විසම්මුතියේ නිදහස ආරක්ෂා කිරීම.

ඈ) ප්‍රතිකර්ම ඇතුළුව පරිපාලනමය සහ ස්වාධීන අධිකරණ ක්‍රියාපටිපාටි සඳහා ඵලදායී හා කාර්යක්ෂම ප්‍රවේශයක් ඇති කිරීම

ඉ) සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල දූෂණය තුරන් කිරීම

ඊ) ප්‍රාදේශීය ප්‍රජාවන්ට තම පරිසරය රැකබලා ගැනීමට සහ පාරිසරික වගකීම් වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ හැකි රජයේ මට්ටම්වලට පැවරීමට හැකිවන පරිදි ශක්තිමත් කිරීම

### 14 විධිමත් අධ්‍යාපනයකට සහ තිරසාර ජීවන රටාවකට අවශ්‍ය දැනුම, සාරධර්ම සහ කුසලතාවයන් අන්තර්ග්‍රහණය කිරීම.

අ) සියලු දෙනා හට විශේෂයෙන් ළමුන් සහ තරුණ ප්‍රජාව ඇතුලත්ව තිරසාර සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාකාරී දායකත්වයක් සපුරාලිය හැකිවන අධ්‍යාපන අවස්ථා බලගැන්වීම.

ආ) තිරසාර අධ්‍යාපන ක්‍රමවේදයක් උදෙසා කලා හා මානව ශාස්ත්‍ර මෙන්ම විද්‍යාවන්හි දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

ඇ) පාරිසරික හා සමාජයීය අභියෝග පිළිබඳව දැනුවත් කිරීම උදෙසා ජනමාධ්‍ය වල කාර්යභාරයන් වැඩි දියුණු කිරීම.

ඈ) තිරසාර දිවි පැවැත්මක් උදෙසා සදාචාරාත්මක සහ ආධ්‍යාත්මික අධ්‍යාපනයේ පවතින වැදගත්කම හඳුනාගැනීම.

## 15 සියලුම ජීවීන් විෂයෙහි මනා ගරුත්වයකින් සහ අවධානයකින් යුතුව සංග්‍රහ කිරීම

අ) මිනිස් වාසය ආශ්‍රිතව ඇති කරන සතුන්ට හිරිහැර කිරීම වැලැක්වීම සහ ඔවුන්ට සිදුවිය හැකි පීඩාවන්ගෙන් ආරක්ෂා කිරීම

ආ) ආන්තික, දිගු හෝ වළක්වා ගත හැකි යම් පීඩාවන් ඇති කෙරෙන දඩයම් කිරීම්, උගුල් සැකසීම් සහ මසුන් ඇල්ලීමේ ක්‍රමවලින් සතුන් ආරක්ෂා කිරීම

ඇ) ඉලක්කගත නොවන කොට්ඨාස වෙත සිදුවන ග්‍රහණයන් සහ විනාශ කිරීම් ඉවත් කිරීම හෝ ඒවා හැකිතාක් සුරට අවම කරගැනීම

## 16 ඉවසීම , අවිහිංසාව හා සාමය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

අ) සියලුම ජනයා සහ ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය, එකමුතුභාවය සහ සහයෝගිතාව දිරිමත් කිරීමට සහයවීම

ආ) ප්‍රචණ්ඩ ගැටුම් වැලැක්වීම සඳහා පුළුල් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම මෙන්ම පාරිසරික ගැටුම් සහ සෙසු ආරවුල් කළමනාකරණය කිරීම සහ විසඳීම උදෙසා සහයෝගී ගැටලු විසඳීමේ ක්‍රමවේද භාවිතයට ගැනීම

ඇ) ප්‍රකෝපකාරී නොවන අභිලාශ ගතවන පරිදි ජාතික ආරක්ෂක පද්ධතීන් නිර්හමුදාකරණයට ලක් කිරීම සහ පාරිසරික ප්‍රතිසංස්කරණ ඇතුළු සාමකාමී අරමුණු සඳහා හමුදා සම්පත් ප්‍රතිව්‍යුහගතකරණයට ලක් කිරීම.

ඇ) න්‍යෂ්ටික , ජීව විද්‍යාත්මක සහ විෂ සහිත අවි සහ සෙසු විනාශකාරී ආයුධ භාවිතය පිටු දැකීම

ඉ) පාරිසරික ආරක්ෂාව සහ සාමය සඳහා වන පරිදි කක්ෂීය සහ අභ්‍යවකාශය භාවිත කිරීම

ඊ) සාමය වනාහී තමන්, වෙනත් පුද්ගලයන්, වෙනත් සංස්කෘතීන්, අනෙකුත් ජීවයන්, පෘථිවිය යන සියල්ල අන්තර්ගත වන පරිදි සමස්තයක් ලෙසින් නිවැරදි සබඳතාවයන් විසින් නිර්මාණකරණය කරන ලද පූර්ණ සංදිග්ධයක් වන බවයි.

## ඉදිරි මාර්ගය....

ඉතිහාසයේ කිසිදාක නොවූ පරිදි, පොදු ඉරණම නව ආරම්භයක් සොයන ලෙසට අපහට ආරාධනා කර ඇත. පෘථිවි ප්‍රඥප්තියේ මූලධර්මයන් එවන් වූ නව ආරම්භයක පොරොන්දුවක් වනු ඇත. මෙකී පොරොන්දුව ඉටු කරනු වස් ප්‍රඥප්තියේ අරමුණු සහ වටිනාකම් අනුගමනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අප කැපවිය යුතුය.

මේ සඳහා මනසේ සහ හදවතේ වෙනස්වීමක් අවශ්‍ය වේ. ගෝලීය අන්තර් රදා පැවැත්ම පිළිබඳ නව හැඟීමක් සහ විශ්වීය වගකීමක් එය අපේක්ෂා කරනු ඇත. තිරසාර ජීවන රටාවක් පිළිබඳව වන දැක්ම පරිකල්පනීයව අපවිසින් වර්ධනය කරගත යුතු සේම දේශීයව, ජාතිකව, කලාපීය සහ ගෝලීය වශයෙන් එය අදාළ කරගත යුතුයි. අපගේ සංස්කෘතික විවිධත්වය වටිනා උරුමයක් වන අතර විවිධ සංස්කෘතීන් ඔවුන්ගේ දර්ශනය සාක්ෂාත් කර ගැනීම පිණිස සුවිශේෂී මාර්ග වෙත එළඹෙනු ඇත. පෘථිවි ප්‍රඥප්තිය පිළිබඳව වන ගෝලීය සංවාදය ගැඹුරු සහ විස්තාරණය කළ යුත්තක් වන අතර, මක් නිසාද යත් සත්‍යය සහ ප්‍රඥාව සඳහා පවතින සහයෝගීතාව අධ්‍යනය කිරීමෙන් අපට ඉගෙනගැනීමට බොහෝ දෑ පවතින හෙයිනි.

ජීවිතයේ බොහෝවිට වැදගත් වටිනාකම් අතර අවිනිශ්චිතතාවයක් මතුවිය හැකිය. මේ හරහා සංකීර්ණ වූ වරණයන් අදහස් වේ. කෙසේ වුවද අපේක්ෂිත විවිධත්වය සාක්ෂාත් කිරීම පිනිස සාමය, සමඟිය භාවිතය සහ දිගුකාලීන ඉලක්කගත කෙටිකාලීන අරමුණු අපවිසින් සොයාගත යුතුව ඇත. මෙහිදී සෑම පුද්ගලයෙකුටම පවුලකට, සංවිධානයකට, සහ සමස්ත ප්‍රජාවට ඉටුකිරීමට වැදගත් කාර්යභාරයන් ඇත. කලාව, විද්‍යාව, ආගම, අධ්‍යාපන ආයතන, මාධ්‍ය, ව්‍යාපාර, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍යයන් ඒ කෙරෙහි නිර්මානාත්මක නායකත්වයක් පිරිනැමීම අපේක්ෂා කරනු ඇත. ඵලදායී පාලන ව්‍යුහයක් උදෙසා රජය, සිවිල් සමාජය සහ ව්‍යපාරික හවුලකාරීත්වය අත්‍යවශ්‍ය ප්‍රවේශයක් වනු ඇත.

තිරසාර ගෝලීය ප්‍රජාවක් ගොඩනැඟීම උදෙසා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ඒ යටතේ පවතින ජාත්‍යන්තර ගිවිසුම් යටතේ ඔවුන්ගේ වගකිම් ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීමට සහය වීම සහ පාරිසරික තත්වයන් සහ සංවර්ධනය උදෙසා පෘථිවි ප්‍රඥප්තියෙ පවතින මූලධර්මයන් කෙරෙහි අන්තර්ජාතිකව නීතිමය බැඳියාවක් ලබාදීම කෙරෙහිද ගෝලෝය රාජ්‍යයන් සිය දායකත්වය ලබාදීම ප්‍රතිනිර්මාණය කිරීම වැදගත්ය.

අපගේ මතකයේ කාලයක් උදෙන පුරාවට ජීවිතය පිළිබඳ නව පිබිදීමක් ඇතිකරනු වස් එය සාක්ෂාත් කර ගැනීමේ ස්ථිර අධිෂ්ඨානය මත තිරසාරභාවය, යුක්තිය සහ සාමය සඳහා වාන් අරගලාය් වේගවත් කිරීම හරහා ජීවිතයේ ප්‍රීතිමත් සැමරුමක් ගොඩනැගීමට කටයුතු කළ යුතුය.

සිංහල පරිවර්තනය

ඩබ්ලිව්. ඩී. මනෝජ්,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
නිති අධ්‍යයන අංශය,
විවෘත විශ්වවිද්‍යාලය,
නාවල, නුගේගොඩ,
ශ්‍රී ලංකාව.

(පරිවර්තනයට දායකත්වය: ආධුනික කථිකාචාර්ය එම්.බී. අයි.එන්. ප්‍රනාන්දු,කේ.පී, සතිර කිත්මිණ, ටී.ඒ.තේවාහෙට්ටිගේ, කේ.එස්.ජයසුන්දර, එම්.එස්.ඩී.ප්‍රනාන්දු.)